# ආණ්ඩුවේ නිවේදන

එල්ඩී.-බී. 21/78 IV.

## 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වන වගන්තිය සමඟ කියවිය යුතු ඒ පනතේ 23 (2) වන වගන්තිය යටතේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ නියමාවලිය.

එම්. ඒ. මුනිදාස,
වැඩබලන ලේකම්,
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1996 සැප්තැම්බර් මස 13 දින,
කොළඹ දී ය.

### නියමාවලිය

1. මේ නියමාවලිය 1996 අංක 12 දරන ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාල (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1990 ජනවාරි මස 05 දින අංක 591/18 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1990 අංක 01 දරන ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාල නියමාවලිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(අ) එහි 4 වන ඡේදයේ (ඕ) වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් :-

" (ඕ) කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව, විශ්ව විද්‍යාලය විසින් අනුමත කරනු ලබන අධ්‍යයන අංශවල පර්යේෂණ පැවැත්වීම සඳහා අරමුදල් වෙන්කර දීම සහ වෙනත් පහසුකම් සැපයීම; "

(ආ) එහි 7 වන ඡේදයේ (I) වන අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අළුත් අනුඡේදය ආදේශ කිරීමෙන් :-

" (1) (අ) (ආ)ඡේදයේ විධිවිධානවලට යටත්ව, විවෘත විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා, ඒ විශ්ව විද්‍යාලයේ පාලක සභාව විසින් නිර්දේශිත නම් තුනකින් යුත් මූල මණ්ඩලයකින්, කොමිෂන් සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් අවුරුදු තුනක කාලයක් සඳහා පත් කරනු ලැබිය යුතුය.

(ආ) කිසිම තැනැත්තකු අනුක්‍රමික දුර කාල දෙකකට වැඩි ගණනකට එම විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වශයෙන් පත් කරනු නොලැබිය යුතුය.

(ඇ) විවෘත විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා, කොමිෂන් සභාව විමසීමෙන් පසු, ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය ".

(ඇ) එහි 13 වන ඡේදයේ (2) වන අනුඡේදයේ (VII) වන වගන්තියේ " ගුවන් විදුලි " යන වචන වෙනුවට " ජනමාධ්‍ය " යන වචනය ආදේශ කිරීමෙන්.

(ඈ) එහි 14 වන ඡේදයේ (2) වන අනුඡේදයේ :-

(i) " (I) වන ඡේදයෙන් " යන වචන හා ඉලක්කම් වෙනුවට " (I) වන අනුඡේදයෙන් " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ii) ඒ අනුඡේදයේ (xiv) වන හා (xv) වන වගන්තිවල " අධ්‍යාපන අංශ " යන වචන වෙනුවට " අධ්‍යයන අංශ" යන වචන ආදේශ කිරීමෙන් ;

(iii) ඒ අනුඡේදයේ (xvi) සහ (xvii) වන වගන්ති වෙනුවට මෙහි පහත දැක්වෙන අලුත් වගන්ති ආදේශ කිරීමෙන් ;

" (xvi)(අ) විවෘත විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනික තාක්ෂණය සැලසුම් කිරීම සහ සංවර්ධනය සඳහා, සහ විවෘත විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන් සඳහා යෝග්‍ය ඉගැන්වීමේ උපකාරක ද්‍රව්‍ය සම්පාදනය කිරීම සඳහා බලතල, කාර්ය, සහ කර්තව්‍ය අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය යුතු අධ්‍යාපනික තාක්ෂණ මණ්ඩලයක් පත් කිරීම ;

(ආ) අධ්‍යාපනික තාක්ෂණ මණ්ඩලය මෙහි පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය.

(i) උපකුලපතිවරයා ;
(ii) අධ්‍යාපනික තාක්ෂණ අධ්‍යක්ෂවරයා ;
(iii) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා ;
(iv) අධ්‍යක්ෂ, ප්‍රාදේශීය අධ්‍යාපන සේවය ;
(v) පුස්තකාලයාධිපති ;
(vi) අධ්‍යාපන අධ්‍යයන අංශයේ ප්‍රධානියා ;
(vii) අධ්‍යාපනික තාක්ෂණ අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියේ සහ ඊට ඉහළ ශ්‍රේණිවලට අයත් සෑම ආචාර්යවරයෙක්ම ;
(viii) සනාතන සභාව විසින් සිය සාමාජිකයන් අතුරින් තෝරා පත්කර ගන්නා එක් සාමාජිකයෙක්.
(ix) එක් එක් පීඨ මණ්ඩලය විසින් එහි සාමාජිකයන් අතුරෙන් තෝරා පත්කර ගන්නා එක් සාමාජිකයෙක්.

(ඇ) අධ්‍යාපනික තාක්ෂණ මණ්ඩලයේ ලේකම්වරයා, උපකුලපතිවරයාගේ නිර්දේශය මත පාලක සභාව විසින් පත් කරනු ලැබිය යුතුය.

(ඈ) (ආ) අතුරු වගන්තියේ (ix) අතුරු අනුවගන්තිය යටතේ තෝරාපත් කර ගන්නා සාමාජිකයා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියේ හෝ ඊට ඉහළ ශ්‍රේණියකට අයත් විය යුතු අතර ඔහු තෝරා පත්කර ගන්නා ලද දිනයේ සිට අවුරුදු දෙකක් ධුරය දැරිය යුතුය.

(xvii)(අ) ප්‍රාදේශීය අධ්‍යාපන සේවා සැලසුම් කිරීම හා සංවර්ධනය කිරීම සහ ඉගෙනීමේ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය සම්පත් සැපයීම සඳහා, බලතල, කාර්ය සහ කර්තව්‍ය අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය යුතු ප්‍රාදේශීය අධ්‍යාපන සේවා මණ්ඩලයක් පත් කළ යුතුය.

(ආ) ප්‍රාදේශීය අධ්‍යාපන සේවා මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය.

(i) උපකුලපතිවරයා ;
(ii) ප්‍රාදේශීය අධ්‍යාපන සේවා අධ්‍යක්ෂවරයා ;
(iii) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා ;
(iv) අධ්‍යාපනික තාක්ෂණ අධ්‍යක්ෂවරයා ;
(v) පුස්තකාලයාධිපතිවරයා ;
(vi) ලේඛකාධිකාරීවරයා ;
(vii) මූල්‍යාධිකාරීවරයා ;
(viii) අධ්‍යක්ෂ /මෙහෙයුම් ;
(ix) දත්ත සැකසුම් කළමනාකරු ;

(x) සනාතන සභාවේ ලේකම් ;
(xi) ප්‍රාදේශීය අධ්‍යාපන සේවයේ සියලු සහකාර අධ්‍යක්ෂවරු ;
(xii) ප්‍රාදේශීය මධ්‍යස්ථාන භාරව සිටින එක් එක් තැනැත්තා ;
(xiii) එක් එක් පීඨ මණ්ඩලය විසින් ඒ ඒ මණ්ඩලයේ සාමාජිකයන් අතුරෙන් තෝරා පත් කර ගන්නා සාමාජිකයෙක් ;
(xiv) පීඨවල සියලු සහකාර ලේඛකාධිකාරිවරු.

(ඇ) ප්‍රාදේශීය අධ්‍යාපන සේවා මණ්ඩලයේ ලේකම්වරයා, මෙහි ඉහත (ආ) අතුරු වගන්තියේ (xi) සහ (xii) අතුරු අනු වගන්තිවල සඳහන් තැනැත්තන් අතුරෙන්, උපකුලපතිවරයාගේ නිර්දේශය මත සභාව විසින් පත්කරනු ලැබිය යුතු ය.

(ඈ) මෙහි ඉහත (ආ) අතුරු වගන්තියේ (xiii) අතුරු අනු වගන්තිය යටතේ තෝරා පත්කර ගන්නා සාමාජිකයා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියේ හෝ ඊට ඉහළ ශ්‍රේණියකට අයත් විය යුතු අතර ඔහු තෝරා පත්කර ගන්නා ලද දිනයේ සිට අවුරුදු දෙකක් ධුරය දැරිය යුතුය.

(ඉ) එහි 15 වන ඡේදයේ :-

(i) ඒ ඡේදයේ (2) වන අනුඡේදයේ (v) වගන්තිය ඉවත්කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කිරීමෙන් ;

" (v) එක් එක් අධ්‍යයන අංශයේ ප්‍රධානියා ; " .

(ii) එහි (2) වන අනුඡේදයේ (vii) වන වගන්තියේ " සහ " යන වචනය ඉවත් කිරීමෙන් ;
(iii) එහි (2) වන අනුඡේදයේ (viii) වන වගන්තිය එහි (ix) වන වගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ; සහ
(iv) එහි (2) වන අනුඡේදයේ (vii) වන වගන්තියට ඉක්බිතිවම, මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් ;

" (viii) ප්‍රාදේශීය අධ්‍යාපන සේවයේ අධ්‍යක්ෂවරයා සහ "

(v) එහි (6) වන අනුඡේදයේ (vii) වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට, මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කිරීමෙන් :-

" (vii) සුදුසු යයි සනාතන සභාවට පෙනී යන සංඛ්‍යාවක්, සනාතන සභාවේ ස්ථාවර කමිටු තත් කාර්ය කමිටු හෝ මණ්ඩල පත් කිරීම සහ විශේෂයෙන් –

(අ) පුස්තකාල සහ තොරතුරු සේවා කමිටුවක් ;
(ආ) ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමේ කමිටුවක් ;
(ඇ) විෂයමාලා සහ වැඩ සටහන් සංවර්ධන කමිටුවක් ;
(ඈ) විෂයමාලා සහ අගැයීමේ කමිටුවක් ;
(ඉ) උපාධි ප්‍රදාන කමිටුවක් ;
(ඊ) අතුරු ව්‍යවස්ථා කමිටුවක් ; සහ
(උ) පරිවාස අධ්‍යයන නිවාඩු කමිටුවක් පත් කිරීම සහ ඒවාට විෂය කරුණු නියම කිරීම ; එම කමිටුවල වාර්තා සලකා බැලීම හා වෙනස් කිරීම් ඇතිව හෝ නොමැතිව ඒ වාර්තා අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම. "

(ඊ) එහි 16 වන ඡේදයේ :-

(i) එහි (2) වන අනුඡේදයේ " අධ්‍යාපන අංශ " යන වචන වෙනුවට " අධ්‍යයන අංශ " යන වචන ආදේශ කිරීමෙන්,
(ii) එහි (3) වන සහ (4) වන අනුඡේද ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන අලුත් අනුඡේද ආදේශ කිරීමෙන් :-

" (3) ස්වාභාවික විද්‍යා පීඨයෙහි පහත දැක්වෙන අධ්‍යයන අංශ තිබිය යුතුය :-

(i) උද්භිද විද්‍යාව ;
(ii) රසායන විද්‍යාව ;
(iii) සෞඛ්‍ය විද්‍යාව ;
(iv) ගණිතය ;
(v) භෞතික විද්‍යාව ;
(vi) සත්ව විද්‍යාව ;
(vii) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන වෙනත් ඕනෑම අංශයක්.

(4) ඉංජිනේරු තාක්ෂණ පීඨයෙහි පහත දැක්වෙන අධ්‍යයන අංශ තිබිය යුතුය :-

(i) කෘෂිකර්ම හා වැවිලි ඉංජිනේරු විද්‍යාව ;
(ii) සිවිල් ඉංජිනේරු විද්‍යාව ;
(iii) විදුලි හා පරිගණක ඉංජිනේරු විද්‍යාව ;
(iv) ඉංජිනේරු විද්‍යා ගණිතය හා දර්ශනය ;
(v) යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව ;
(vi) පේෂකර්ම තාක්ෂණ විද්‍යාව ;
(vii) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන වෙනත් ඕනෑම අංශයක් ".

(iii) එහි (5), (6) සහ (7) වන අනුඡේදවල " අධ්‍යාපන අංශ " යන වචන යෙදෙන සෑම තැනකම ඒ වෙනුවට " අධ්‍යයන අංශ " යන වචන ආදේශ කිරීමෙන් ;

(උ) එහි 17 වන ඡේදයේ (iii) වන වගන්තියේ " පීඨාධිපතිවරයා තෝරා ගත යුතුය " යන වචන වෙනුවට " පීඨාධිපතිවරයා තෝරා පත් කර ගත යුතුය " යන වචන ආදේශ කිරීමෙන් ;

(ඌ) එහි 18 වන ඡේදයේ :-

(i) (1) වන අනුඡේදයේ " අධ්‍යාපන අංශ " යන වචන වෙනුවට " අධ්‍යයන අංශ " යන වචන ආදේශ කිරීමෙන් ;
(ii) (2) වන අනුඡේදයේ (ii) වන හා (iv) වන වගන්ති ඉවත් කොට ඒ වෙනුවට පිළිවෙලින් මෙහි පහත දැක්වෙන වගන්ති ආදේශ කිරීමෙන් :-

" (ii) අධ්‍යාපනික තාක්ෂණ අධ්‍යක්ෂවරයා හෝ, අධ්‍යාපනික තාක්ෂණ මණ්ඩලයේ සාමාජිකයකු විය යුතු ඔහුගේ නාමිකයා ;
(iv) පීඨයේ ස්ථිර කථිකාචාර්යවරුන් සහ සහකාර කථිකාචාර්යවරුන් විසින් ඔවුන් අතුරෙන් තෝරා පත් කරගනු ලබන සාමාජිකයන් දෙදෙනෙක් ; "

(iii) එහි (2) වන අනුඡේදයේ (vi) හා (vii) වන වගන්ති (viii) සහ (ix) ලෙස පිළිවෙලින් නැවත අංක යෙදීමෙන් ;
(iv) එහි (2) වන අනුඡේදයේ (v) වන වගන්තියට ඉක්බිතිවම, මෙහි පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කිරීමෙන් :-

" (vi) ප්‍රදේශීය අධ්‍යාපන සේවා අධ්‍යක්ෂවරයා හෝ ප්‍රාදේශීය අධ්‍යාපන සේවා මණ්ඩලයේ සාමාජිකයකු විය යුතු ඔහුගේ නාමිකයා ;

(vii) පුස්තකාලයාධිපතිවරයා හෝ ඔහුගේ නාමිකයා; "

(v) එහි (2) වන අනුඡේදයේ නැවත අංක යෙදූ (viii) වන වගන්තියේ "පස්දෙනෙකුට" යන වචන වෙනුවට "හත් දෙනෙකුට" යන වචන ආදේශ කිරීමෙන් ;

(vi) එහි (3) වන හා (4) වන අනුඡේද පිළිවෙලින් (4) වන හා (5) වන අනුඡේද ලෙස නැවත අංක යෙදීමෙන් ;

(vii) එහි (2) වන අනුඡේදයට ඉක්බිතිවම, මෙහි පහත දැක්වෙන අලුත් අනුඡේදය ඇතුළත් කිරීමෙන් .–

(3)(1) (2) වන අනුඡේදයේ (ix) වන වගන්තිය යටතේ තෝරා පත්කර ගන්නා සාමාජිකයකු තෝරා පත් කර ගනු ලැබූ දින සිට ගණන් බලන ලද එක් අවුරුද්දක කාලසීමාවක් සාමාජිකයකු ලෙස ධූරය දැරිය යුතු අතර තෝරා පත්කර ගනු ලැබූ වෙනත් යම් සාමාජිකයකු තෝරා පත්කර ගනු ලැබූ දින සිට ගණන් බලන ලද අවුරුදු තුනක කාලයක් ධූරය දැරිය යුතුය ; තවද ඔවුහු නැවත තෝරා පත්කර ගැනීම සඳහා සුදුස්සන් විය යුතුය.

(ii)(2) වන අනුඡේදයේ (ix) වන වගන්තිය යටතේ තෝරා පත්කර ගන්නා සාමාජිකයන්, මේ නියමාවලියේ 17 වන ඡේදයේ (i) වන අනුඡේදය යටතේ පීඨාධිපතිවරයා තෝරා පත්කර ගැනීම හා සම්බන්ධ යම් රැස්වීමක සහ විභාග පිළිබඳ වූ හෝ ඒ හා සම්බන්ධ වූ යම් රැස්වීමක කටයුතුවලින් බැහැර කළ යුතු අතර එම බැහැර කිරීම එසේම තිබුණ ද ඒ යම් රැස්වීමක් යථා පරිදි පවත්වනු ලැබුවාක් ලෙස සැලකිය යුතුය ;".

10-307

---

## 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනත

### 50(1) වැනි වගන්තිය යටතේ වූ ඉඩම් අත්පත් කර ගැනීමේ නියමය

1969 අංක 36 දරන කර්මාන්ත සංවර්ධන පනතේ 50(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කර්මාන්ත සංවර්ධන අමාත්‍ය, ක්ලෙමන්ට් වික්ටර් ගුණරත්න වන මම කර්මාන්තකරුවන්ගේ සුභ සිද්ධිය පිණිස කර්මාන්ත ජනපදයක් පිහිටුවා පවත්වාගෙන යාම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයට ලබා දිය හැකි වනු පිණිස මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් ඉඩම අත්කර ගැනීමේ නියමය මෙයින් අනුමත කරමි.

කර්මාන්ත සංවර්ධන අමාත්‍ය.

1996 සැප්තැම්බර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

#### උපලේඛනය

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ කරන්දෙණිය මැතිවරණ කොට්ඨාශය තුල කරන්දෙණිය උප දිසාපති කොට්ඨාශයේ කොස් අතුමානාන ගමෙහි පිහිටි නිහාල් ගුණවර්ධන ගාල්ල කොට්ඨාශය භාර මිනින්දෝරු අධිකාරී විසින් සාදන ලද අංක 2535 හා 93.04.30 දින දරන පිඹුරෙහි කැබලි අංක 02 ලෙස සලකුණු කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.9403 වන පහත මායිම් ඇති ඉඩම :-

උතුරට : මූලික පිඹුර ගාල්ල අංක 1330 හි කැබලි අංක 02 ; නැගෙනහිරට : මූලික පිඹුර ගාල්ල අංක 2535 හි කැබලි අංක 03 ; දකුණට : මූලික පිඹුර ගාල්ල අංක 2535 හි කැබලි අංක 01 ; බටහිරට : මූලික පිඹුර ගාල්ල 1330 හි කැබලි අංක 02.

10-369/1

---

## 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනත

### 50(1) වැනි වගන්තිය යටතේ වූ ඉඩම් අත්පත් කර ගැනීමේ නියමය

1969 අංක 36 දරන කර්මාන්ත සංවර්ධන පනතේ 50(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කර්මාන්ත සංවර්ධන අමාත්‍ය, ක්ලෙමන්ට් වික්ටර් ගුණරත්න වන මම කර්මාන්තකරුවන්ගේ සුභ සිද්ධිය පිණිස කර්මාන්ත ජනපදයක් පිහිටුවා පවත්වාගෙන යාම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයට ලබා දිය හැකි වනු පිණිස මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් ඉඩම අත්කර ගැනීමේ නියමය මෙයින් අනුමත කරමි.

කර්මාන්ත සංවර්ධන අමාත්‍ය.

1996 සැප්තැම්බර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

#### උපලේඛනය

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරලේ (නැගෙනහිර) කඳුපිට පත්තුවේ (උතුර) ගලිගමුව ප්‍රාදේශීය බල්ලපාන ගමෙහි කේ. එස්. පණ්ඩිතරත්න බලයලත් මිනින්දෝරුතැන විසින් සාදන ලද අංක 3837 හා 93.04.16 දින දරන පිඹුරෙහි ප්‍රමාණයෙන් අක්කර 10 රූඩ් 01 පර්චස් 06.999ක් වූ (හෙක්ටාර් 4.16573)ක් වූ මේපිල්ඩ්වත්ත හෙවත් තොට්ල්ලබොක්ක වත්ත හා පන්සල් වත්ත.

උතුරට : කොළඹ සිට මහනුවර දක්වා ප්‍රධාන මාර්ගය ; නැගෙනහිරට : මේපිල්ඩ්වත්ත හෙවත් තොට්ල්ල බොක්ක වත්ත හා පන්සල්වත්ත. (පොල් ඉඩම හා රබර්) ඇම්. ඇම්. ආර්. ප්‍රනාන්දු මිය හා තවත් අයට අයිති ; දකුණට : කපුගහමුල්හේන (රබර්) ඩබ්. ඒ. වී. බණ්ඩාර සහ තවත් අයට අයිති පන්වත්තහේන (රබර් හා වත්ත) එස්. පී. ඩේවිඩ් හා බෙදාදෙන ලද රජයේ ඉඩම (මු. වි. කැ. 2169) පිටකොටුවත්ත හා ඕවලවත්ත. ආර්. ඒ. එම්. පෙරේරා හා තවත් අයට අයිති ; බටහිරට : බෙදා දෙන ලද රජයේ ඉඩම (මු. වි. කැ. 2169) හා පිටකොටුවත්ත හා ඕවලවත්ත ආර්. ඒ. එම්. පෙරේරා හා තවත් අයට අයිති.

10-369/2

---

## භාරකාර ආදායම් ආඥාපනත

1947 අංක 12 (86 වැනි අධිකාරය) දරන භාරකාර ආදායම් ආඥාපනතේ 5(1) (ඇ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වාණිජ අධ්‍යක්ෂ, මානෙල් මහින්ද ගෝනදෙනිය හේවගේ වන මම, මෙහි උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කර ඇති ආයතන එම ආඥාපනතේ කාර්යයන් සඳහා 1996.10.11 වැනි දින සිට වලංගු වන පරිදි අනුමත කළ ණය දෙන ආයතන බවට මෙම නිවේදනයෙන් ප්‍රකාශ කරමි.

එම්. ජී. හේවගේ,
වාණිජ අධ්‍යක්ෂ.

1996 සැප්තැම්බර් මස 25 වැනි දින,
කොළඹ දී ය.

#### උපලේඛනය

01. ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව
02. ඒසියන් ෆිනෑන්ස් ලිමිටඩ්
    ලියාපදිංචි අංකය එන්. (පී. බී. එස්.) 94

10-374/2